# ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රය

## අති විශෙෂ

අංක 2396/32 - 2024 අගෝස්තු මස 07 වැනි බදාදා - 2024.08.07

(රජයේ බලයපිට ප්‍රසිද්ධ කරන ලදී)


## I වැනි කොටස: (I) වැනි ඡෙදය - සාමාන්‍ය

### රජයේ නිවේදන

**1991 අංක 25 දරන ශ්‍රී ලංකා විදුලි සංදේශ පනත**

1996 අංක 27 දරන ශ්‍රී ලංකා විදුලි සංදේශ (සංශෝධන) සහ 2024 අංක 39 දරන ශ්‍රී ලංකා විදුලි සංදේශ (සංශෝධන) පනත් මගින් සංශෝධිත 1991 අංක 25 දරන ශ්‍රී ලංකා විදුලි සංදේශ පනතේ 17 (10) වගන්තිය සමඟ කියවිය යුතු 71 (1) වගන්තිය යටතේ තාක්ෂණ අමාත්‍යවරයා විසින් සාදන ලද රෙගුලාසි

**රනිල් වික්‍රමසිංහ,**
ජනාධිපති,
තාක්ෂණ අමාත්‍ය.

2024 අගෝස්තු මස 7 දින කොළඹ දී.

රෙගුලාසි

1. මෙම රෙගුලාසි 2024 අංක 1 දරන විදුලි සංදේශ යටිතල පහසුකම් හවුල් භාවිතාවේ රෙගුලාසි ලෙස හැඳින්වේ.

2. මෙම රෙගුලාසි පනතේ 17 (2) වගන්තිය යටතේ බලපත්‍රලාභී සියලුම ක්‍රියාකරුවන්ට අදාළ වේ.

3. ගුවන් විදුලි ප්‍රවේශ ජාලය (RAN) හවුල් භාවිතාව යන්න සඳහා බහු ක්‍රියාකරක ගුවන් විදුලි ප්‍රවේශ ජාලය (MORAN) සහ බහු ක්‍රියාකරක මූලික ජාලය (MOCN) යන ක්‍රමවේද දෙකම ඇතුළත් වේ.


1A - G 42422 — 09 (2024/08)

*මෙම අති විශෙෂ ගැසට් පත්‍රය* www.documents.gov.lk *වෙබ් අඩවියෙන් බාගත කළ හැක.*

4. ඇන්ටෙනා කුළුණු හවුල් භාවිතාව සම්බන්ධයෙන් මෙම රෙගුලාසිවලට අමතරව කොමිෂන් සභාව විසින් නිකුත් කරන ලද මාර්ගෝපදේශ වලටද අනුකූල විය යුතුය.

5. මෙම රෙගුලාසි යටතේ ක්‍රියාකරුවන් දෙදෙනෙකු අතර මූලික ජාලය හවුලේ භාවිතයට අවසර නැත.

6. මෙම රෙගුලාසිවල අරමුණ වනුයේ :

(i) පවතින විදුලි සංදේශ යටිතල පහසුකම් භාවිතයේ අකාර්යක්ෂමතාව සහ අනවශ්‍ය ප්‍රතිබහුඉදිකරණය අවම කිරීම සඳහා ;

(ii) සියලුම විදුලි සංදේශ ක්‍රියාකරුවන්ගේ ප්‍රාග්ධන සහ මෙහෙයුම් වියදම් අඩු කිරීම.

(iii) සාමාජීය වශයෙන් කාර්යක්ෂම යටිතල පහසුකම් සඳහා වන ආයෝජන දිරිමත් කිරීම සහ විදුලි සංදේශ යටිතල පහසුකම් ප්‍රතිගුණනයෙන් ඇතිවන නාස්තිය වැළැක්වීම;

(iv) පහසුවෙන් ප්‍රතිගුණනය කළ නොහැකි සහ ගුණනය කිරීම පාරිසරික සහ සාමාන්‍ය මහජන බලපෑමට ලක් නොවන පරිදි විදුලි සංදේශ යටිතල පහසුකම් හවුල් භාවිතාව හරහා සාධාරණ තරඟකාරිත්වයක් ප්‍රවර්ධනය කිරීම;

(v) මිල, ගුණාත්මකභාවය සහ සේවා සුලභතාවය තුලින් පාරිභෝගිකයින්ට ප්‍රතිලාභ ලබා දීම සහ පාරිසරික ආරක්ෂාව සම්බන්ධ ඔවුන්ගේ සැලකිල්ලට බඳුන් වන කරුණු අවම කිරීමට ප්‍රයත්න දැරීම ;

(vi) විදුලි සංදේශ යටිතල පහසුකම් වැඩි කිරීමෙන් ඇතිවන පාරිසරික බලපෑම පිළිබඳව මහජනතාවගේ සහ පාරිසරික හා ක්‍රම සම්පාදන ආයතනයන්වල ගැටළු සැළකිල්ලට භාජනය කිරීමට;

(vii) විදුලි සංදේශ යටිතල පහසුකම් ඉදිකිරීම සහ නඩත්තු කිරීම අවම කිරීම තුලින් වඩාත් පරිසර හිතකාමී භාවිතයන් ප්‍රවර්ධනය කිරීම.

7. ඉල්ලුම් කරන ක්‍රියාකරුවන්, හවුලේ භාවිතා කරන ක්‍රියාකරුවන් සහ හිමිකාරී ක්‍රියාකරුවන් අතර අදාළ විදුලි සංදේශ යටිතල පහසුකම් හවුලේ භාවිතා කළ හැකි ක්‍රමවේදයක් මෙම රෙගුලාසි මගින් ඉදිරිපත් කරනු ලබයි.

8. **යටිතල පහසුකම් හවුල් භාවිතාවට අදාල පොදු මූලධර්ම**

8.1 විදුලි සංදේශ යටිතල පහසුකමක් හිමි, ක්‍රියාත්මක කරන හෝ භාවිතා කරන ඕනෑම හිමිකාරී ක්‍රියාකරුවෙකුට අදාළ වන බලපත්‍ර කොන්දේසින්ට යටත්ව තමන් හා අන්‍යෝන්‍ය වශයෙන් එකඟ වූ වාණිජ්‍යමය සහ තාක්ෂණික කොන්දේසි මත ඉල්ලුම් කරන ක්‍රියාකරුවෙකු සමඟ එම යටිතල පහසුකම් හවුලේ භාවිතා කළ හැකිය.

8.2 විදුලි සංදේශ යටිතල පහසුකමක් හිමි, ක්‍රියාත්මක කරන හෝ භාවිතා කරන ඕනෑම හිමිකාරී ක්‍රියාකරුවෙකු එම විදුලි සංදේශ යටිතල පහසුකම් භාවිතය සඳහා ප්‍රවේශය ලබා ගැනීමට කරනු ලබන ඉල්ලීමක් සම්බන්ධයෙන් සාකච්ඡා කිරීමට, යටිතල පහසුකම් හවුලේ භාවිතා කිරීමේ ගිවිසුම (ISA) කට එළඹීමට බැඳී සිටී.

8.3 ගුවන් විදුලි ප්‍රවේශ ජාලය (RAN) හවුල් භාවිතාවේදී, හවුලේ භාවිතා කිරීමේ අයදුම්පතක් සමඟ කලින් එකඟවූ වාණිජ්‍යමය සහ තාක්ෂණික කොන්දේසි සහිත යටිතල පහසුකම් හවුලේ භාවිතා කිරීමේ ගිවිසුමෙහි (ISA) පිටපතක් කොමිෂන් සභාවේ අනුමැතිය සඳහා ඉදිරිපත් කළ යුතුය.

8.4 සාධාරණ තරගකාරීත්වයක් ප්‍රවර්ධනය කිරීම සඳහා, තරගකාරීත්වයට අදාල අංග සහ ක්‍රියාකරුවන්ගේ ප්‍රති තරඟකාරී හැසිරීම් කොමිෂන් සභාව විසින් තක්සේරුවට ලක් කළ යුතුය.

8.5 හිමිකාරී හෝ හවුලේ භාවිතා කිරීමේ ක්‍රියාකරුවන් විසින් අවසාන පරිශීලකයින්ට සේවා සැපයීමේදී පවත්වා ගත යුතු බලපත්‍රානුකුල බැඳීම් සේවා ගුණාත්මක භාවයන්ට අදාල අවශ්‍යතාවයන්, ජාල ප්‍රවර්ධනය සහ පාරිසරික වගකීම්, පිරික්සුම්, අදාළ සියලුම නීති සහ ගිවිසුම් වලට අනුකූලව අඛණ්ඩව පවත්වාගෙන යාමට වග බලා ගත යුතුය.

8.6 ක්‍රියාකරුවන් විසින් හවුලේ භාවිතා කල හැකි විදුලි සංදේශ යටිතල පහසුකම් පිළිබඳ දත්ත සමුදායක් පවත්වාගෙන යා යුතු අතර එයට අනෙකුත් ක්‍රියාකරුවන්ට/සැපයුම්කරුවන්ට පිවිසිය හැකි විය යුතුය. දත්ත සමුදාය සඳහා අවශ්‍ය වන දත්ත පිළිබඳ තොරතුරු කොමිෂන් සභාව විසින් කලින් කලට තීරණය කළ යුතු අතර, එම සක්‍රීය සහ අක්‍රීය විදුලි සංදේශ දත්ත වලට යටිතල පහසුකම් මූලිකාංග ආදියෙහි පවතින ධාරිතාවන්, භෞතික අවකාශය, අඩවි භුගෝලීය ස්ථාන යනාදිය ඇතුළත්විය යුතු නමුත් ඒවාට පමණක් සීමා නොවිය යුතුය.

9. **යටිතල පහසුකම් බෙදාගැනීමේ ගිවිසුම (ISA) සම්බන්ධයෙන් ඉල්ලුම් කරන/හිමිකාරී ක්‍රියාකරුවන් සතු වගකීම්**

9.1 තීරණය කිරීමේ ක්‍රියාවලිය සම්බන්ධ සාමාන්‍ය විධිවිධාන

9.1.1 විදුලි සංදේශ යටිතල පහසුකම් හවුලේ භාවිතා කිරීමට අපේක්ෂිත ක්‍රියාකරුවන්ට යටිතල පහසුකම් හවුලේ භාවිතා කිරීමේ ගිවිසුමෙහි (ISA) හි නියමයන් සහ කොන්දේසි පිළිබඳව තීරණය කිරීමට සහ එකඟතාවයකට පැමිණීමට (අනිවාර්ය නම්) අයිතියක් හෝ වගකීමක් පවතින්නේ ය.

9.1.2 හිමිකාරී ක්‍රියාකරු විසින් තම විදුලි සංදේශ යටිතල පහසුකම් හවුලේ භාවිතා කිරීම සඳහා ඉල්ලීම් ලැබෙන කාලානුක්‍රමික අනුපිළිවෙල අනුව, පළමුව පැමිණෙන පුද්ගලයින්ට පළමුව සේවය ලබාදීමේ පදනම මත අනෙකුත් හවුලේ භාවිතා කිරීමේ ක්‍රියාකරුවන් සමඟ විදුලි සංදේශ යටිතල පහසුකම් හවුලේ භාවිතාව සිදු කළ යුතුය.

9.1.3 අපක්ෂපාතීත්වය සහ වෙනස් කොට නොසැලකීම යන මූලධර්ම මත පදනම්ව විදුලි සංදේශ යටිතල පහසුකම් හවුලේ භාවිතාව සිදුකළ යුතුය.

9.1.4 සියලුම පාර්ශ්වයන් විසින් යටිතල පහසුකම් හවුලේ භාවිතා කිරීමේ ගිවිසුම (ISA) සම්බන්ධයෙන් වන සියලුම තීරණ ගැනීමට අදාල සාකච්ඡාවන් ඉතා සද්භාවයෙන් පවත්වාගෙන යා යුතුය.

9.1.5 විදුලි සංදේශ යටිතල පහසුකම් හිමිකාරී ක්‍රියාකරු විසින්

අ) තීරණයන්ට අදාල සාකච්ඡාවන්ට බාධා කිරීම හෝ ප්‍රමාද කිරීම;

ආ) විදුලි සංදේශ යටිතල පහසුකම් අවශ්‍යතාවය හඳුනා ගැනීමට අවශ්‍ය තොරතුරු ද ඇතුළුව යටිතල පහසුකම් හවුලේ භාවිතා කිරීමේ ගිවිසුමට (ISA) අදාළ තොරතුරු සැපයීම ප්‍රතික්ෂේප කිරීම සිදු නොකළ යුතුය.

9.1.6 විදුලි සංදේශ යටිතල පහසුකම් හවුලේ භාවිතා කිරීම සම්බන්ධයෙන් වන කරුණු පිළිබඳව තීරණයට අදාල සාකච්ඡා කිරීමේදී සාකච්ඡා කරනු ලබන ක්‍රියාකරුවන් ප්‍රමාණවත් වන තොරතුරු එකිනෙකා වෙත සැපයිය යුතුය. එවැනි තොරතුරු සැම විටම රහසිගත ලෙස අදාල පාර්ශවයන් විසින් සළකනු ලැබිය යුතුය. එවැනි ඕනෑම ඉල්ලීමකට ඉක්මන් ප්‍රතිචාර දැක්වීම මගින් ප්‍රමාදයන් වලක්වා ගත යුතුය.

9.1.7 සැම යටිතල පහසුකම් හවුලේ භාවිතා කිරීමේ ගිවිසුමක්ම (ISA) ලේඛනගත විය යුතු අතර අදාළ පාර්ශ්වයන් විසින් ගිවිසුම්ගත වූ නියමයන් සහ කොන්දේසි එහි සඳහන් වී තිබිය යුතුය.

9.1.8 කිසියම් ක්‍රියාකරුවෙකුගේ යටිතල පහසුකම් හවුලේ භාවිතා කිරීමට කොමිෂන් සභාව නියම කර ඇත් නම්, එවැනි ක්‍රියාකරුවන් එලෙස නියම කරන ලද විදුලි සංදේශ යටිතල පහසුකම් හවුලේ භාවිතා කිරීමට අදාල තීරණ ගැනීමේ සාකච්ඡා සිදු කිරීමට බැඳී සිටී.

9.1.9 යටිතල පහසුකම් වෙළඳපොලේ සැලකිය යුතු වෙළඳපොල අධිකාරයක් (SMP) පවත්නා ලෙස හඳුනාගෙන ඇති හිමිකාරී ක්‍රියාකරුවන් කොමිෂන් සභාව විසින් අනුමත කරන ලද නිර්දේශිත අපර්නය (Reference Offer) ප්‍රකාශ කිරීම අවශ්‍ය වේ.

9.2 **හවුලේ භාවිතා කිරීමේ ගිවිසුමට අදාල තීරණ ගැනීමේ සාකච්ඡා සිදු කිරීමේ ක්‍රියා පටිපාටිය**

9.2.1 ඉල්ලුම් කරන ක්‍රියාකරු වෙත ක්ෂණිකව ලබා දිය හැකි වන සේ ඇමුණුම A හි දක්වා ඇති හවුලේ භාවිතා කිරීමට ඉල්ලුම් කිරීමේ පෝරමයක් හිමිකාරී ක්‍රියාකරු සතුවිය යුතුය.

9.2.2 විදුලි සංදේශ යටිතල පහසුකම් හවුලේ භාවිතා කිරීමට බලාපොරොත්තු වන ඉල්ලුම් කාර ක්‍රියාකරු විසින් හවුලේ භාවිතා කිරීමට ඉල්ලුම් කිරීමේ පෝරමයක් සම්පූර්ණ කර හිමිකාරී ක්‍රියාකරු වෙත ඉදිරිපත් කළ යුතුය.

9.2.3 ඉල්ලීම කරනු ලබන ක්‍රියාකරු විසින් සිය පෝරමය ඉදිරිපත් කරනු ලබන දිනයේ සිට වැඩ කරන දින 7ක් ඇතුළත, හිමිකාරී ක්‍රියාකරු විසින් ශක්‍යතා අධ්‍යයන කටයුතු අවසන් කර ඇමුණුම B හි දක්වා ඇති පෝරමයට අනුව සිය තීරණය ඉල්ලුම් කරන ක්‍රියාකරු වෙත ලිඛිතව ලබා දිය යුතුය.

9.2.4 **ලබා දෙන තීරණය :**

අ) විදුලි සංදේශ යටිතල පහසුකම් පවත්නා බව තහවුරු කිරීම සහ යටිතල පහසුකම් හවුලේ භාවිතා කිරීමේ ගිවිසුමක් (ISA) සම්පූර්ණ කිරීම සඳහා ක්‍රියා පටිපාටිය ආරම්භ කිරීමට යෝජනාවක් ඉදිරිපත් කිරීම; හෝ

ආ) අයදුම්පත්‍රය සම්බන්ධයෙන් යෝජිත සාධාරණ සංශෝධනයන්ට යටත්ව විදුලි සංදේශ යටිතල පහසුකම් පවත්නා බව තහවුරු කිරීම සහ යටිතල පහසුකම් හවුලේ භාවිතා කිරීමේ ගිවිසුම (ISA) සම්පූර්ණ කිරීමේ ක්‍රියා පටිපාටිය ආරම්භ කිරීමට යෝජිත දිනයක් ඉදිරිපත් කිරීම ; හෝ

ඇ) හවුලේ භාවිතා කිරීමේ ඉල්ලීමක් ප්‍රතික්ෂේප කිරීම විය හැක.

9.2.5 ශක්‍යතා අධ්‍යයනය සම්පූර්ණ කර සහ අදාළ පහසුකම පවතින බවට තහවුරු කර ඇත්නම්, යටිතල පහසුකම් බෙදාගැනීමේ ගිවිසුම (ISA) සම්පූර්ණ කිරීම සඳහා ගතවන කාලය පහත සඳහන් දිනයන්හි සිට වැඩ කරන දින 7ක් නොඉක්මවිය යුතුයඃ

අ) පහසුකම පවතින අවස්ථාවන්හිදී, හිමිකාරී ක්‍රියාකරුගේ භාර ගැනීමේ ලිපියේ දිනය, හෝ

ආ) පිළිගත හැකි සංශෝධනයන්ට යටත්ව පහසුකම් ලබා දීමට හැකි අවස්ථාවන්හිදී , යෝජිත සංශෝධන පිළිගනිමින් ඉල්ලුම් කරන ක්‍රියාකරු විසින් හිමිකාරී ක්‍රියාකරු වෙත යොමු කරන ලද ලිපියේ දිනය.

9.2.6 ඉල්ලා සිටින විදුලි සංදේශ යටිතල පහසුකම් සංවර්ධනය කිරීමට හෝ වෙනස් කිරීමට අවශ්‍ය විටකදී ඊට ගතවන කාලයද සැලකිල්ලට ගෙන, ඉල්ලා සිටින විදුලි සංදේශ යටිතල පහසුකම් හවුලේ භාවිතා කිරීම ආරම්භ කිරීමේ දිනය, දෙපාර්ශවය විසින් යටිතල පහසුකම් හවුලේ භාවිතා කිරීමේ ගිවිසුම (ISA) අත්සන් කළ දිනයේ සිට සාධාරණ කාලයක් ඇතුළත විය යුතු නමුත්, එම කාලය වැඩ කරන දින 30ක් නොඉක්මවිය යුතුය.

9.2.7 ඉල්ලුම් කරන ක්‍රියාකරු යටිතල පහසුකම් හවුලේ භාවිතා කිරීමට ඉල්ලා සිටින විට, එම විදුලි සංදේශ යටිතල පහසුකමෙහි පවතින ධාරිතාව සම්පූර්ණයෙන් භාවිතා වී ඇත්නම්, හිමිකාරී ක්‍රියාකරු එම විදුලි සංදේශ යටිතල පහසුකමට එම අමතර ධාරිතාව තවදුරටත් තාක්ෂණිකව දරා ගැනීමට හැකියාව පවතින අවස්ථාවන්හිදී එකී ධාරිතාව පුළුල් කළ යුතුය.

9.2.8 ඉල්ලා සිටිනු ලබන විදුලි සංදේශ යටිතල පහසුකම් සංවර්ධනය කිරීම හෝ වෙනස් කිරීම වෙනුවෙන් හිමිකාරී ක්‍රියාකරු විසින් දරනු ලබන පිරිවැය, අන්‍යෝන්‍ය වශයෙන් එකඟ වූ කොන්දේසි මත හවුලේ භාවිතා කරන ක්‍රියාකරු විසින් දරනු ලැබිය යුතුය.

අ) හවුලේ භාවිතා කිරීම සඳහා ඉල්ලා සිටින පහසුකම් යාවත්කාලීන කිරීම් සහ වෙනස් කිරීම් කටයුතු සිදු කිරීමේදී හිමිකාරී ක්‍රියාකරු විසින් සඵලදායි ලෙස දරන ලද පිරිවැය සමානුපාතිකව හිලව් වන පරිදි හිමිකාරී ක්‍රියාකරුට ගෙවීමක් සිදු කිරීමට ඉල්ලුම් කරන ක්‍රියාකරු බැඳී සිටී.

ආ) අවශ්‍ය සංවර්ධනය හෝ වෙනස් කිරීමට අදාළ පිරිවැය තක්සේරු කල යුතු වන්නේ, අදාල පාර්ශවයන් විසින් ඒකාබද්ධව හෝ එම පාර්ශවයන්ට එකඟ විය නොහැකි විට හෝ එය වඩාත් ප්‍රායෝගික නොවන්නේ යැයි සැලකෙන විට දෙපාර්ශවයෙහි එකගතාවයෙන් හෝ එලෙස එකගතාවයට එළබීමට නොහැකි විට කොමිෂන් සභාව විසින් පත් කල ස්වාධින තෙවන පාර්ශවයක් විසින්ය.

9.3 **යටිතල පහසුකම් හවුලේ භාවිතා කිරීමේමේ ගිවිසුමෙහි (ISA) විස්තර**

යටිතල පහසුකම් හවුලේ භාවිතා කිරීමේ ගිවිසුම (ISA) සතුව පහත සඳහන් අවම අවශ්‍යතා පැවතිය යුතුයඃ

අ) යටිතල පහසුකම් හවුලේ භාවිතා කිරීමේ ගිවිසුම් (ISA) වර්ගය;

ඇ) යටිතල පහසුකම් හවුලේ භාවිතා කිරීමේ ගිවිසුමෙහි (ISA) ප්‍රධාන කොන්දේසි;

ඇ) ක්‍රියාවලියේ ප්‍රධාන පියවරයන්වල කාල ප්‍රාන්තර ;

ඉ) වාණිජ (මිලකරණය) සහ තාක්ෂණික (සේවා ගුණාත්මකභාවය (QoS), හවුලේ භාවිතා කිරීමේ ශෛලිය, නඩත්තු ක්‍රමවේද) තොරතුරු

**10. ගුවන් විදුලි ප්‍රවේශ ජාලය (RAN) හවුලේ භාවිතා කිරීම සම්බන්ධ යටිතල පහසුකම් හවුලේ භාවිතා කිරීමේ ගිවිසුම් (ISA)**

11, 12, 13 සහ 14 රෙගුලාසි අදාළ වන්නේ ගුවන්විදුලි ප්‍රවේශ ජාලය (RAN) හවුලේ භාවිතා කිරීම සම්බන්ධ යටිතල පහසුකම් හවුලේ භාවිතා කිරීමේ ගිවිසුම් (ISA) සඳහා පමණි.

**11. යටිතල පහසුකම් හවුලේ භාවිතා කිරීමේ ගිවිසුමෙහි (ISA) කෙටුම්පතක් කොමිෂන් සභාවට ඉදිරිපත් කිරීම**

11.1 යෝජිත යටිතල පහසුකම් හවුලේ භාවිතා කිරීමේ ගිවිසුම (ISA) ක්‍රියාත්මක කිරීමට පෙර, එවැනි ගිවිසුමක් සම්බන්ධයෙන් සමාලෝචනය කිරීම සහ අනුමත කිරීම සඳහා කොමිෂන් සභාව වෙත ඉදිරිපත් කිරීමට අයදුම්කරුවන් බැඳී සිටී. අයදුම්කරුවන් මෙම රෙගුලාසිවල දක්වා ඇති මූලධර්මවලට අනුකූලව සිය අයදුම්පත ඉදිරිපත් කළ යුතුය.

11.2 වැඩිදුර තක්සේරුවක් අවශ්‍යවන්නා වූ ගැටළු නොමැත්තේ නම්, යෝජිත යටිතල පහසුකම් හවුලේ භාවිතා කිරීමේ ගිවිසුම (ISA) ලැබුණු දිනයේ සිට වැඩ කරන දින 15ක් ඇතුළත කොමිෂන් සභාව සිය මූලික තීරණය ප්‍රකාශයට පත් කළ යුතු අතර, මහජන අදහස් දැක්වීම අවසන් කිරීමෙන් පසුව දින 10ක් ඇතුළත යටිතල පහසුකම් හවුලේ භාවිතා කිරීමේ ගිවිසුම (ISA) සඳහා අවසාන අනුමැතිය ලබා දෙනු ඇත.

11.3 ඕනෑම යෝජිත ගිවිසුමක් අනුමත කිරීම පිළිබඳ අවසාන අධිකාරී බලය කොමිෂන් සභාව සතු වන අතර මහජන සුභසිද්ධිය සඳහා නොවන බවට සැලකෙන ඕනෑම ගිවිසුමක් ප්‍රතික්ෂේප කිරීමටද අයිතිය ඇත. සැක සහිත තැන් මග හැරීමට, දැනට පවත්නා යටිතල පහසුකම් හවුලේ භාවිතා කිරීමේ ගිවිසුම් (ISA) වලට සිදුකරන කුමන හෝ සංශෝධන, ගිවිසුම් බල රහිත කිරීමේ යෝජනා ද ඇතුලත්ව ඒවාට පූර්ව අනුමැතිය ලබා ගැනීම සඳහා කොමිෂන් සභාව වෙත එවැනි සංශෝධන හෝ බල රහිත කිරීම් සිදු කිරීමට පෙර ඉදිරිපත් කළ යුතුය.

11.4 සියලුම අයදුම්කරුවන් තමන්ට අදාළ බලපත්‍රවල සඳහන් වගකීම් හා අනෙකුත් නීති හා රෙගුලාසීන්ට අනුගත විය යුතුය.

**12. යටිතල පහසුකම් හවුලේ භාවිතා කිරීමේ ගිවිසුම (ISA) සමාලෝචනය/අනුමත කිරීමේ ක්‍රියාවලිය පිළිබඳ කොමිෂන් සභාව සතු වගකීම**

යෝජිත යටිතල පහසුකම් හවුලේ භාවිතා කිරීමේ ගිවිසුම (ISA) අනුමත කිරීම සහ අනුමත යටිතල පහසුකම් හවුලේ භාවිතා කිරීමේ ගිවිසුම් (ISA) සංශෝධනය කිරීම සඳහා පහත දක්වා ඇති ක්‍රියා පටිපාටිය අදාළ වේ. ඉල්ලා සිටින තොරතුරු සැපයීමට අයදුම්කරුවන් අපොහොසත් වුවහොත්, අනුමත කිරීමේ ක්‍රියාවලිය අත්හිටුවීමට කොමිෂන් සභාව වෙත අයිතියක් ඇත.

**12.1 යටිතල පහසුකම් හවුලේ භාවිතා කිරීමේ ගිවිසුම (ISA) සමාලෝචන ක්‍රියාවලිය**

කොමිෂන් සභාවේ යටිතල පහසුකම් හවුලේ භාවිතා කිරීමේ කෙටුම්පත් ගිවිසුම් (ISA) ඇගයීම් සමාලෝචන ක්‍රියාවලිය අදියර හයකින් සමන්විත වේ.

12.1.1 **අදියර 1 - කොමිෂන් සභාව වෙත දැනුම් දීම**

අ) යටිතල පහසුකම් හවුලේ භාවිතා කිරීමේ ගිවිසුම් (ISA) ඇතිකර ගැනීමට අදහස් කරන හිමිකාරී සහ හවුලේ භාවිතා කිරීමේ ක්‍රියාකරුවන් විසින් ඇමුණුම C හි දක්වා ඇති විධිමත් ඒකාබද්ධ අයදුම්පතක් (''අයදුම්පත'') සමග සම්පූර්ණ කරන ලද යටිතල පහසුකම් හවුලේ භාවිතා කිරීමේ ගිවිසුම (ISA) ඉදිරිපත් කිරීමෙන් කොමිෂන් සභාව වෙත දැනුම් දිය යුතුය.

ආ) රෙගුලාසි අංක 13 හි විස්තර කර ඇති පරිදි තොරතුරු ඉදිරිපත් කළ යුතුය.

ඇ) අයදුම්පත ලැබුණු විට, එලෙස ඉදිරිපත් කරන ලද අයදුම්පත්‍රය සම්පූර්ණ කර ඇති හෝ නොමැති බව කොමිෂන් සභාව විසින් පරීක්ෂා කර බැලීම සහ, අයදුම්පතෙහි සම්පූර්ණත්වයේ විමර්ශන ක්‍රියාවලියේ ප්‍රතිඵලය සහ යෝජිත යටිතල පහසුකම් හවුලේ භාවිතා කිරීමේ ගිවිසුම (ISA) පිළිබඳ නියාමන ඇගයීම කොමිෂන් සභාව මඟින් ආරම්භ කරන්නේද යන්න පිළිබඳව අයදුම්කරුවන්ට දැනුම් දෙනු ඇත.

ඈ) අසම්පූර්ණ අයදුම්පත්‍ර ඉදිරිපත් කරනු ලබන කිසියම් අවස්ථාවන්හිදී කොමිෂන් සභාව විසින් එම අයදුම් පත්‍ර නොලැබූ සේ සලකා ප්‍රතික්ෂේප කරනු ලැබේ.

12.1.2 **අදියර 2- අපේක්ෂිත ප්‍රතිලාභ සහ අවදානම් පිළිබඳ නියාමන ඇගයීම**

අ) අයදුම්පත්‍රය සම්පූර්ණ කර ඇති බව තහවුරු වූ විට, යෝජිත යටිතල පහසුකම් හවුලේ භාවිතා කිරීමේ ගිවිසුම (ISA) මගින් තරඟකාරීත්වය සම්බන්ධව සහ පාරිභෝගිකයින්ට පොදුවේ ඇති විය හැකි විභව්‍ය ප්‍රතිලාභ සහ අවදානම් පිළිබඳ ඇගයීමක් කොමිෂන් සභාව විසින් සිදු කරනු ඇත.

ආ) මෙම ඇගයීම පහසු කිරීම සඳහා, කොමිෂන් සභාව අයදුම්කරුවන්ගෙන් වැඩිදුර තොරතුරු සහ පැහැදිලි කරගැනීම් සඳහා ඉල්ලා සිටිය හැක. තොරතුරු ඉල්ලීමෙහි සඳහන් නිශ්චිත කාල සීමාව තුළ කොමිෂන් සභාවෙන් කරනු ලබන ඕනෑම තොරතුරු ඉල්ලීමකට අයදුම්කරුවන් ප්‍රතිචාර දැක්වීම අවශ්‍ය වේ.

ඇ) යෝජිත යටිතල පහසුකම් හවුලේ භාවිතා කිරීමේ ගිවිසුම (ISA) අනුමත කිරීමට හෝ ප්‍රතික්ෂේප කිරීමට කොමිෂන් සභාව ගන්නා තීරණය රඳා පවතින්නේ අදාළ වෙළඳපොළ(වල්) කෙරෙහි යටිතල පහසුකම් හවුලේ භාවිතා කිරීමේ ගිවිසුම (ISA) හේතුවෙන් ඇතිවන සම්පූර්ණ බලපෑමේ ප්‍රමාණාත්මකතාව මත ය.

ඈ) මෙම බලපෑම ඇගයීමට සහ තරඟකාරීත්වයට ඇති විය හැකි විභව්‍ය අවදානම් සහ පාරිභෝගිකයින්ට ඇති ප්‍රතිලාභ හඳුනා ගැනීමට, කොමිෂන් සභාව පහත ක්‍රියාවලිය අනුගමනය කරනු ඇත :

(i) අදාළ වෙළඳපොල අර්ථ දැක්වීම
යෝජිත යටිතල පහසුකම් හවුලේ භාවිතා කිරීමේ ගිවිසුමේ (ISA)හි ප්‍රතිඵලයක් ලෙස බලපෑමට ලක්විය හැකි නිෂ්පාදන/සේවා සහ භූ ගෝලීය වෙළඳපොළ(වල්) කොමිෂන් සභාව විසින් හඳුනාගනු ඇත. ඉන් අනතුරුව කොමිෂන් සභාව සිදු කරන ආර්ථික ඇගයීම පදනම් වනුයේ මෙම හඳුනාගත් වෙළඳපොළ(වල්)හි අපේක්ෂිත ප්‍රතිඵලයන් මතය.

(ii) ප්‍රතිපරිසිද්ධික තත්ත්වයන් ස්ථාපිත කිරීම

කොමිෂන් සභාවෙහි ඇගයීම සිදු කිරීම සඳහා ප්‍රතිපරිසිද්ධික විශ්ලේෂණයක් අනුගමනය කරනු ඇත. මෙම රාමුව යටතේ, යෝජිත යටිතල පහසුකම් හවුලේ භාවිතා කිරීමේ ගිවිසුම (ISA) නොමැති තත්වයක් (''ප්‍රතිපරිසිද්ධික තත්වය'') හා සසඳන කල යෝජිත යටිතල පහසුකම් හවුලේ භාවිතා කිරීමේ ගිවිසුමෙහි (ISA) (''තත්‍ය තත්වය'') ප්‍රතිඵලයක් ලෙස වෙළඳපොලේ ඇති විය හැකි විභව්‍ය තරඟකාරී ප්‍රතිඵල කොමිෂන් සභාව විසින් හඳුනා ගනු ඇත. යෝජනාව ඉදිරිපත් කරන අවස්ථාවේ වෙළඳපොළ තත්ත්වය සහ යටිතල පහසුකම් හවුලේ භාවිතා කිරීමේ ගිවිසුම (ISA)හි කොන්දේසි මත පදනම්ව, ප්‍රතිපරිසිද්ධික තත්ත්වය කොමිෂන් සභාව විසින් එක් එක් සිද්ධිය අනුව තීරණය කරනු ඇත.

(iii) තරඟයට ඇති විය හැකි විභව්‍ය අවදානම් හඳුනා ගැනීම

යෝජිත යටිතල පහසුකම් හවුලේ භාවිතා කිරීමේ ගිවිසුම (ISA) අනුමත කිරීම මගින් ඇති වන විභව්‍ය අවදානම් හඳුනා ගැනීම සඳහා කොමිෂන් සභාව ප්‍රධාන මූලධර්මයන් අනුගමනය කරනු ඇත. එම මූලධර්මයන් වනුයේ :

අ. අයදුම්කරුවන් අතර සෘජු තරඟකාරිත්වයට යෝජිත යටිතල පහසුකම් හවුලේ භාවිතා කිරීමේ ගිවිසුම (ISA) මගින් ඇති විය හැකි බලපෑම;

ආ. අනෙක් ක්‍රියාකරුවන් සහ සපයන්නන් අතර තරඟකාරිත්වයට යෝජිත යටිතල පහසුකම් බෙදාගැනීමේ ගිවිසුම (ISA) මඟින් ඇති විය හැකි බලපෑම සහ

ඇ. ශ්‍රී ලංකාවේ විදුලි සංදේශ අංශයේ ප්‍රතිඵල කෙරෙහි ඇති විය හැකි බලපෑම

(iv) යෝජිත ගිවිසුමක් හේතුවෙන් විදුලි සංදේශ වෙළඳපොළ කෙරෙහි සැලකිය යුතු සෘණාත්මක ප්‍රතිඵල ඇතිකරන බවට හෝ ජාතික ආරක්ෂාවට අවදානමක් ඇති කරන බවට කොමිෂන් සභාව නිගමනය කරන්නේ නම්, ගිවිසුම ප්‍රතික්ෂේප කිරීමට කොමිෂන් සභාවට නිසැකවම අයිතියක් ඇත්තේය.

(v) තරඟකාරිත්වයට ඇති විය හැකි විභව්‍ය අවදානම් කොමිෂන් සභාව මගින් හඳුනා ගත් විට, මෙම බලපෑම් සමඟ කටයුතු කිරීම සඳහා අයදුම්කරුවන්ට යම් වගකීම් සහ පිළියම් ඉදිරිපත් කිරීමට සිදු විය හැකිය.

(vi) විභව්‍ය කාර්යක්ෂමතා සහ පාරිභෝගික ප්‍රතිලාභ හඳුනා ගැනීම
කොමිෂන් සභාවේ ඇගයීමේදී යෝජිත යටිතල පහසුකම් හවුලේ භාවිතා කිරීමේ ගිවිසුම (ISA) නිසා ඇතිවිය හැකි විභව්‍ය ප්‍රතිලාභයන් ප්‍රතිපරිසිද්ධික කරුණු වලට සාපේක්ෂව සලකා බැලිය යුතුය. මෙම විභව්‍ය ප්‍රතිලාභ අවසානයේ

අදාළ පහළ මට්ටමේ වෙළඳපොල (වල්හි) අවසාන පරිශීලකයින් වෙත ලැබෙනු ඇතැයි අපේක්ෂා කෙරෙන අතර යටිතල පහසුකම් හවුලේ භාවිතා කිරීමේ ගිවිසුම (ISA) එලදායී තරගකාරිත්වය අවම කිරීමට තුඩු නොදෙන බවට කොමිෂන් සභාවේ මතය තහවුරුකෙරේ.

vii) යෝජිත යටිතල පහසුකම් හවුලේ භාවිතා කිරීමේ ගිවිසුමෙහි (ISA) ශුද්ධබලපෑම ඇගයීම
ඉහත ඇගයීම මත පදනම්ව, යෝජිත යටිතල පහසුකම් හවුලේ භාවිතා කිරීමේ ගිවිසුම (ISA) මගින් ශුද්ධ ප්‍රතිලාභ වැඩිවීමක් ලබා දීමට හැකියාව පවතීද යන්න තීරණය කිරීම සඳහා කොමිෂන් සභාව විසින් තරගකාරීත්ව රීති වලට අනුකූලව සකසන ලද ක්‍රමවේද යොදා ගනු ලැබේ. කොමිෂන් සභාව ප්‍රතිතරගකාරී හෝ වෙනත් සෘණාත්මක බලපෑම්වල අවදානම හඳුනා ගත්විට, මෙම බලපෑම් මගහරවා ගැනීම සඳහා ප්‍රතිකර්ම සහ කැපකිරීම් සම්බන්ධයෙන් යෝජනා ඉදිරිපත් කිරීමට හවුල්කාර පාර්ශවයන්ට සිදු විය හැකිය. එම ප්‍රතිකර්ම කොමිෂන් සභාවේ අපේක්ෂාවන් සපුරනු ලබන්නේ නැති නම්, කොමිෂන් සභාවට යෝජිත යටිතල පහසුකම් හවුලේ භාවිතා කිරීමේ ගිවිසුම (ISA) ප්‍රතික්ෂේප කළ හැකිය.

12.1.3 **අදියර 3 - මූලික තීරණය**
නියාමන ඇගයීම මත පදනම්ව, කොමිෂන් සභාව විසින් අදියර 2 හිදී කරන ලද සියලුම තොරතුරු ඉල්ලීම් සඳහා පුළුල් සහ සම්පූර්ණ ප්‍රතිචාරයන් දැක්වීමේ සිට වැඩ කරන දින 15ක් ඇතුළත යෝජිත යටිතල පහසුකම් හවුලේ භාවිතා කිරීමේ ගිවිසුම (ISA) සම්බන්ධයෙන් වූ මූලික තීරණය කොමිෂන් සභාව විසින් ප්‍රකාශයට පත් කරනු ලබයි.

ඇගයීම සිදු කිරීමෙන් පසු, කොමිෂන් සභාව පහත සඳහන් මූලික අවස්ථා තුනෙන් එකක් තීරණය කරනු ඇතඃ

අ) යෝජිත යටිතල පහසුකම් හවුලේ භාවිතා කිරීමේ ගිවිසුම (ISA) විරෝධතාවයකින් තොරව අනුමත කිරීම ; හෝ

ආ) යෝජිත යටිතල පහසුකම් හවුලේ භාවිතා කිරීමේ ගිවිසුම (ISA) හඳුනාගත් කිසියම් ගැටළු විසඳීම සඳහා අයදුම්කරුවන් විසින් ඉදිරිපත් කරනු ලබන යම් යම් ප්‍රතිකර්ම සහ කැපකිරීම් වලට යටත්ව අනුම තකිරීම. හෝ

ඇ) සාමාන්‍ය ලෙස තරගකාරීත්වයට හෝ පාරිභෝගිකයින්ට ඇති විය හැකි අහිතකර බලපෑම් හේතුවෙන් යෝජිත යටිතල පහසුකම් හවුලේ භාවිතා කිරීමේ ගිවිසුම (ISA) ප්‍රතික්ෂේප කිරීම.

12.1.4 **අදියර 4 -ප්‍රසිද්ධ දැන්වීම**
කොමිෂන් සභාව සිය මූලික තීරණය ප්‍රකාශයට පත් කිරීමෙන් පසු, අයදුම්කරුවන්ට මෙන්ම වෙළඳපොල තරගකරුවන් ඇතුළු අනෙකුත් අදාළ පාර්ශවකරුවන්ට තම මූලික මතය සම්බන්ධයෙන් ඔවුන් එකඟ වන්නේද නොවන්නේද යන්න සම්බන්ධයෙන් සාක්ෂි මත පදනම්වූ තර්ක සහිතව අදහස් දැක්වීමට ප්‍රකාශනය සිදු කළ දින සිට වැඩ කරන දින හතක් ඇතුළත කොමිෂන් සභාව විසින් ආරාධනා කරනු ලබයි.

රහස්‍යභාවය පිළිබඳව කාරණා සඳහා අවධානය යොමු කිරීමට යටත්ව, ක්ෂේත්‍රයෙන් ලැබූ අදහස් සම්බන්ධයෙන් අයදුම්කරුවන්ට ප්‍රතිචාර දැක්වීමට අවස්ථාවක් ලබාදෙමින් කොමිෂන් සභාවට මෙම අදහස් ප්‍රකාශයට පත් කළ හැකිය.

12.1.5 **අදියර 5- අයදුම්කරුවන් විසින් යෝජිත පිළියම්**
කිසියම් හඳුනාගත් ගැටළු වලට විසඳුම් දීම සඳහා අයදුම්කරුවන්ට කොමිෂන් සභාව වෙත කැපවීම් ඉදිරිපත් කිරීමට හෝ කැපවීම් ඉදිරිපත් කිරීම තෝරා ගැනීමට අවශ්‍ය විය හැකිය. මෙය එසේ නම්ඃ

අ) කොමිෂන් සභාව එහි මූලික තීරණයේ දී, යෝජිත ගිවිසුම නිසා ඇති විය හැකි බලපෑම් හඳුනා ගන්නා නමුත් එම ගැටළු විසඳීමට අවශ්‍ය ඇතැම් ප්‍රතිකර්ම සඳහා වන අවකාශය හඳුනාගැනීම; හෝ

ආ) අයදුම්කරුවන් මුලින්ම සිදු කල යුතු කැපවීම් තෝරා ගැනීම.

12.1.6 **අදියර 6 - කොමිෂන් සභාවේ අවසාන තීරණය**
අදාළ පාර්ශවකරුවන්ගේ පුළුල් අදහස් සහ අයදුම්කරුවන් විසින් සිදු කරන කුමන හෝ කැපවීම් මත පදනම්ව, කොමිෂන් සභාව සිය අවසන් තීරණය එහි නිල වෙබ් අඩවියේ ප්‍රකාශයට පත් කළ යුතුය. මහජන අදහස් දැක්වීම අවසන් කළ දිනයේ සිට වැඩ කරන දින 10ක් ඇතුළත තම අවසන් තීරණය නිකුත් කිරීම කොමිෂන් සභාව අපේක්ෂා කරයි. අවසාන තීරණය වනු ඇත්තේ යටත් පිරිසෙයින් එකකිනි.

අ) යෝජිත යටිතල පහසුකම් හවුලේ භාවිතා කිරීමේ ගිවිසුම (ISA)අනුමත කිරීම (කොන්දේසි විරහිතව හෝ පිළියම් වලට යටත්ව යන්නෙන් එකකිනි) , හෝ

ආ) යටිතල පහසුකම් හවුලේ භාවිතා කිරීමේ ගිවිසුමෙහි (ISA) අනුමැතිය ප්‍රතික්ෂේප කිරීම.

13. **යටිතල පහසුකම් හවුලේ භාවිතා කිරීමේ ඉල්ලුම් පත්‍රයට අවශ්‍ය තොරතුරු**

13.1 **යෝජිත යටිතල පහසුකම්** යටිතල පහසුකම් හවුලේ භාවිතා කිරීමේ ගිවිසුමෙහි (ISA) විස්තර

(i) යටිතල පහසුකම් යටිතල පහසුකම් හවුලේ භාවිතා කිරීමේ ගිවිසුමෙහි (ISA) පහත දැක්වෙන අවම අවශ්‍යතා සපුරාලිය යුතුය:

අ) **යටිතල පහසුකම්** යටිතල පහසුකම් හවුලේ භාවිතා කිරීමේ ගිවිසුමෙහි (ISA) පාර්ශ්වයන්;

ආ) **යටිතල පහසුකම්** යටිතල පහසුකම් හවුලේ භාවිතා කිරීමේ ගිවිසුම් (ISA) වර්ගය;

ඇ) **යටිතල පහසුකම්** යටිතල පහසුකම් හවුලේ භාවිතා කිරීමේ ගිවිසුමෙහි (ISA) ප්‍රධාන කොන්දේසි;

ඈ) ප්‍රධාන ක්‍රියාවලියන්ගේ පියවරවල කාලසීමාවන්;

ඉ) වාණිජ (මිලකරණය) සහ තාක්ෂණික (සේවා ගුණාත්මකභාවය ( QoS), හවුලේ භාවිතා කිරීමේ ශෛලිය, නඩත්තු ක්‍රමවේද,) තොරතුරු

(ii) එකී පාර්ශ්වයන් විසින් යෝජිත යටිතල පහසුකම් හවුලේ භාවිතා කිරීමේ ගිවිසුමට (ISA) අදාළ වන කොමිෂන් සභාව වෙතින් ලබාගත් සියලුම බලපත්‍ර සහ අනුමැතියන් ඉදිරිපත් කළ යුතුය.

(iii) එකි පාර්ශවයන් ඔවුන්ගේ ඒකාබද්ධ අයදුම්පත්‍රයේ අංගයක් ලෙස අවසාන යටිතල පහසුකම් හවුලේ භාවිතා කිරීමේ ගිවිසුමෙහි (ISA) පිටපතක් ඉදිරිපත් කළ යුතුය.

13.2 **යටිතල පහසුකම් හවුලේ භාවිතා කිරීමේ ගිවිසුම (ISA) සඳහා උපායමාර්ගික සහ ආර්ථික පදනම**
අයදුම්කරුවන් යෝජිත යටිතල පහසුකම් හවුලේ භාවිතා කිරීමේ ගිවිසුමට (ISA) ඇතුළත් වීමට හේතු වූ උපාය මාර්ගික අභිප්‍රේරණය විස්තර කළ යුතුය. මෙයට ඇතුළත් විය යුතු වන්නේ ඃ

අ) යටිතල පහසුකම් හවුලේ භාවිතා කිරීමේ ගිවිසුමෙහි (ISA) ප්‍රතිඵලයක් ලෙස අපේක්ෂිත ප්‍රාග්ධන වියදම් (CAPEX) සහ මෙහෙයුම් වියදම් (OPEX) ඉතුරුම් ප්‍රමාණය කොපමණද යන්න;

ආ) යටිතල පහසුකම් හවුලේ භාවිතා කිරීමේ ගිවිසුමෙහි (ISA) මගින් සංඥා ආවරණ බැඳීම් සපුරාලීම සහ සේවා ගුණාත්මකභාවය (QoS) වැඩිදියුණු කිරීම කෙරෙහි ඇති වේ යයි අපේක්ෂිත බලපෑම.

මෙම ඉතුරුම් හා සේවා වැඩිදියුණු කිරීම් අදාළ වෙළඳපොළ(වල්) වල පාරිභෝගිකයන් ට ලබා දෙන කාර්යක්ෂමතාවයන් හා ප්‍රතිලාභ බවට පරිවර්තනය කර හැකි වන්නේ කොතෙක් දුරටද යන්න අයදුම්කරුවන් විසින් හැකි පරිදි හඳුනාගත යුතුය

ඇ) අපේක්ෂිත කාර්යක්ෂමතාව හෝ අදාළ පාරිභෝගික ප්‍රතිලාභ සම්බන්ධයෙන් අභ්‍යන්තරිකව හෝ බාහිර උපදේශකයින් වෙතින් කරුණු දක්වමින් සකස් කරන ලද ලේඛන මෙම ඇගයීමට සහාය වීම සඳහා අයදුම්කරුවන් විසින් ඉදිරිපත් කල යුතුය.

13.3 **තරඟකාරී අවදානම් සහ ඒවා අවම කර ගැනීමට යෝජිත උපාය මාර්ග පිළිබඳ ඇගයීම**
අයදුම්කරුවන් විසින් යෝජිත යටිතල පහසුකම් හවුලේ භාවිතා කිරීමේ ගිවිසුම (ISA) හේතුවෙන් පැන නැගිය හැකි තරඟකාරී අවදානම් වර්ගයන් පිළිබඳව විස්තර කළ යුතුය. මෙම රෙගුලාසිවල හඳුනාගත් අවදානම් මෙන්ම අයදුම්කරුවන් සැලකිළිමත් විය යුතු සහ අදාළ යැයි විශ්වාස කරන වෙනත් අවදානම් මේවාට ඇතුළත් විය යුතුය.

හඳුනාගත් එක් එක් තරඟකාරී අවදානම් සඳහා, අයදුම්කරුවන් විසින් යටත් පිරිසෙයින් :

අ) මෙම අවදානමේ බලපෑම අවම කිරීම සඳහා විභව්‍ය පිළියම් සැපයීම; හෝ
ආ) යෝජිත යටිතල පහසුකම් හවුලේ භාවිතා කිරීමේ ගිවිසුම (ISA) අවදානමක් ඇති කිරීමට ඉඩක් නොමැති බව ඔවුන් විශ්වාස කරන්නේ මන්දැයි කෙටියෙන් විස්තර කල යුතුය.

13.4 **වාණිජ්‍යමය වශයෙන් සංවේදී තොරතුරු හුවමාරු කිරීමේ විස්තර**
වාණිජමය වශයෙන් සංවේදී තොරතුරු අයදුම්කරුවන්ගේ විවිධ අංශ තුළ සංසරණය සීමා කිරීම සඳහා ක්‍රියාත්මක කෙරෙන ඕනෑම අභ්‍යන්තර ක්‍රියාවලියක්/ක්‍රියා පටිපාටියක් මෙයට ඇතුළත් විය යුතුය. විශේෂයෙන්, හවුලේ භාවිතා කිරීමේ ගිවිසුම යටතේ පහත ක්‍රියාවලි කළමනාකරණය කරන්නේ කෙසේද යන්න පිළිබඳ දැක්මක් සහිත වූ සැලැස්මක් සැපයිය යුතුය:

අ) මෙහෙයුම්;
ආ) කාර්ය සාධන වාර්තාකරණය;
ඇ) ධාරිතාව පිළිබඳ පුරෝකථනය;
ඈ) තාක්ෂණ උපාය මාර්ග සහ උපාය මාර්ගික සැලැස්ම;
ඉ) ජාල සඳහා හවුලේ ආයෝජන කිරීමේ තීරණ.

13.5 **ප්‍රත්‍යස්ථිති සැලැස්ම**
හවුලේ භාවිතා කරන ලද යටිතල පහසුකම් සම්බන්ධයෙන් සවිස්තරාත්මක ජාල ප්‍රත්‍යස්ථිති සැලැස්මක් සහ ආපදා ප්‍රතිසාධන සැලැස්මක් හෝ එහි යාවත්කාලීන කිරීම් අයදුම්කරුවන් විසින් සැපයිය යුතුය.

13.6 **ආයෝජනයන් සම්බන්ධ ඉදිරි දැක්ම සහ ජාල ප්‍රවර්ධනය කිරීමේ සැලසුම්**
යෝජිත යටිතල පහසුකම් හවුලේ භාවිතා කිරීමේ ගිවිසුම (ISA) පවතින විට සහ නො පවතින විට එකිනෙකාගේ දිරිගැන්වීම් වෙන් වෙන්ව ඇගයීමට කොමිෂන් සභාවට හැකිවන පරිදි අයදුම්කරුවන් තනි තනිව තම ආයෝජනයන් සම්බන්ධ ඉදිරි දැක්ම සහ ජාල ප්‍රවර්ධනය කිරීමේ සැලසුම් ඉදිරිපත් කළ යුතුය.

13.7 **ආරක්ෂක අවදානම් හඳුනා ගැනීම සහ ඒවා අවම කිරීම සඳහා ප්‍රවේශය**
ජාල ආරක්ෂාව පිළිබඳ අවශ්‍යතා සපුරාලීමේදී යෝජිත යටිතල පහසුකම් හවුලේ භාවිතා කිරීමේ ගිවිසුම (ISA)හි ප්‍රතිඵලයක් ලෙස ඇතිවිය හැකි ඕනෑම විභව්‍ය බලපෑමක් විසඳීමට අයදුම්කරුවන් විසින් සවිස්තර සැලැස්මක් සැපයිය යුතුය. යෝජිත යටිතල පහසුකම් හවුලේ භාවිතා කිරීමේ ගිවිසුම (ISA) හේතුවෙන් ආරක්ෂක ගැටළු ඇති වීමට ඉඩක් නොමැති බව අයදුම්කරුවන් විශ්වාස කළද, එම කරුණු සලකා බැලිය යුතු අතර ඒ සඳහා බලපෑම් ඇති වීමට ඉඩක් නොමැත්තේ මන්දැයි අයදුම්පතෙහි පැහැදිලිව දැක්විය යුතුය.

13.8 **නියාමන සහ බලපත්‍ර කොන්දේසි සමඟ අඛණ්ඩව අනුකූල වීම**
අයදුම්කරුවන් තම, බලපත්‍රයේ දක්වා ඇති නියාමන සහ නීතිමය බැඳීම්වලට සහ අනෙකුත් නීති සහ රෙගුලාසිවලට අඛණ්ඩව අනුකූල වන බව පෙන්විය යුතුය.

13.9 **"ඉවත්වීමේ සැලැස්ම"**
අයදුම්කරුවන් යටිතල පහසුකම් හවුලේ භාවිතා කිරීමේ ගිවිසුම (ISA) අවලංගු කිරීමට කැමති නම්, ඒ සඳහ වූ සැලැස්ම පිළිබඳ උසස් මට්ටමේ දළ විශ්ලේෂණයක් අයදුම්කරුවන් විසින් සැපයිය යුතුය. හවුලේ භාවිතා කරන ලද ජාලය හරහා සේවා සැපයීමේ සිට වෙනම ජාල හරහා සේවා සැපයීම දක්වා සංක්‍රමණය වීමට ගන්නා පියවර, සේවා බිඳ වැටීම සහ පාරිභෝගිකයින්ට සිදුවිය හැකි කුමන හෝ හානියක් වළක්වන ආකාරයන් මෙම සැලැස්මෙහි පුළුල් ලෙසදැක්විය යුතුය.

14. ගුවන්විදුලි ප්‍රවේශ ජාල (RAN) යටිතල පහසුකම් හවුලේ භාවිතා කිරීමේ ගිවිසුම (ISA) විමර්ශනය කිරීමේදී අනුගමනය කළ යුතු නියාමන ක්‍රියා පටිපාටිය දැක්වෙන ගැලීම් සටහන පරිශිෂ්ට 1 හි මාර්ගෝපදේශයක් ලෙස අමුණා ඇත.

15. **යටිතල පහසුකම් හවුලේ භාවිතා කිරීමේ ගාස්තු**

(i) විදුලි සංදේශ යටිතල පහසුකම් හවුලේ භාවිතා කිරීම සඳහා අදාල ගාස්තු අපක්ෂපාති, සාධාරණ සහ පිරිවැය මත පදනම්ව විය යුතුය.

(ii) ඕනෑම ක්‍රියාකරුවෙකුට ඔවුන්ගේ හවුලේ භාවිතා කිරීමේ පහසුකම් සහ දක්වා ඇති ගාස්තු සාධාරණීකරණය කිරීමක් කොමිෂන් සභාවට අවශ්‍ය විය හැකි අතර, අවශ්‍ය අවස්ථාවන්හිදී, මෙම රෙගුලාසි සහ පනතට අනුකූලව කොමිෂන් සභාව

විසින් තීරණය කරනු ලබන ගාස්තු හෝ ක්ෂේත්‍රයේ පවතින ගාස්තුවලට අනුකූල වන පරිදි ඕනෑම ගාස්තුවක් හෝ සියලුම ගාස්තු ගැලපීමට සිදු විය හැකිය.

16. **ආරවුල් විසඳීම**

(i) කොමිෂන් සභාව මඟින් ආරවුල් විසඳීමේ ක්‍රියාවලිය සම්පූර්ණයෙන්ම ඉදිරිපත් කරන ලද ලේඛන පදනම් කර මෙහෙයවිය හැකි අතර අවශ්‍ය නම් වාචික විමසීමක් සඳහා පාර්ශවයන් කැඳවිය හැක.

(ii) පාර්ශවයන් අතර පැන නගින පහත ආරවුල් මෙම රෙගුලාසිවල විධිවිධානවලට අනුකූලව පහත එක් එක් උප ඡේදයන්ට අදාල කාලසීමාවන් තුළ කොමිෂන් සභාව වෙත යොමු කරන්නේ නම්, කොමිෂන් සභාව මඟින් විසඳිය හැකිය.

(අ) මෙම රෙගුලාසිවල සඳහන් කර ඇති කාල රාමුව තුළ හිමිකාරී ක්‍රියාකරු විසින් හවුලේ භාවිතා කිරීමේ ඉල්ලීමකට පිළිතුරු ලබා නොදීම. හිමිකාරී ක්‍රියාකරුගේ පිළිතුර ලබාදීම සඳහා නියමිතවූ දින සිට වැඩ කරන දින 5 ක් ඇතුළත ආරවුල කොමිෂන් සභාව හමුවට ඉදිරිපත් කිරීම සිදු විය යුතුය;

(ආ) ඉල්ලුම් කරන ක්‍රියාකරු විසින් යම් ආරවුලක් කොමිෂන් සභාව වෙත ඉදිරිපත් කිරීමට අපේක්ෂා කරන්නේ නම් ඒ සම්බන්ධයෙන් කොමිෂන් සභාවට පැමිණිල්ලක් ඉදිරිපත් කළ යුතු වන්නේ:

(i) සංශෝධන යෝජනා කරමින් හිමිකාරී ක්‍රියාකරුගේ දැන්වීම/ලිපිය ඉල්ලුම් කරනු ලබන ක්‍රියාකරු වෙත ලැබුණු දිනයේ සිට වැඩ කරන දින 5ක් ඇතුළත ; හෝ

(ii) හවුලේ භාවිතා කිරීමේ ඉල්ලීම ප්‍රතික්ෂේප කිරීමේ ලිපිය ලැබුණු දිනයේ සිට වැඩ කරන දින 5ක් ඇතුළතය. (ඇ) පාර්ශ්වයන් යටිතල පහසුකම් හවුලේ භාවිතා කිරීමේ ගිවිසුම (ISA) ට එළඹෙන්නේ නොමැති නම්, යටිතල පහසුකම් හවුලේ භාවිතා කිරීමේ ගිවිසුමට (ISA) පිළිබඳ අවසන් තීරණයට සඳහා නියමිත අවසන් දිනයේ සිට වැඩ කරන දින 5ක් ඇතුළත ආරවුල කොමිෂන් සභාවට ඉදිරිපත් කිරීම සිදු විය යුතුය;

(ඇ) හිමිකාරී ක්‍රියාකරුගේ යෝජිත සංශෝධනයන් ඉල්ලුම් කරන ක්‍රියාකරු විසින් පිළිගත් පසුවද පාර්ශවයන් යටිතල පහසුකම් හවුලේ භාවිතා කිරීමේ ගිවිසුම (ISA)කට එළඹ නොමැති නම්, යටිතල පහසුකම් හවුලේ භාවිතා කිරීමේ ගිවිසුම (ISA) පිළිබඳ අවසන් තීරණයට නියමිත අවසන් දිනයේ සිට වැඩ කරන දින 5ක් ඇතුළත කොමිෂන් සභාව වෙත ආරවුල ඉදිරිපත් කිරීම සිදු විය යුතුය;

(iii) යොමු කරන පාර්ශවය විසින් තම පැමිණිල්ල, පාර්ශවයන් අතර ගනුදෙනු වූ ලිපි ලේඛන සහ ඕනෑම පිළිගතහැකි සාක්ෂිකරුවෙකුගේ ප්‍රකාශද ඇතුළුව සියලුම තහවුරුකිරීමේ ලිපි ලේඛන සහ සාක්ෂි සහිතව කොමිෂන් සභාව වෙත ලිඛිතව ඉදිරිපත් කළ යුතුය.

(iv) කොමිෂන් සභාව විසින් පැමිණිල්ල ලැබුණු දිනයේ සිට වැඩ කරන දින 3ක් ඇතුළත පැමිණිල්ල ලැබුණු බව දැන්විය යුතුය.

(v) යොමු කරන පාර්ශවය සතුව පිළිගත හැකි පැමිණිල්ලක් පවතින්නේ ද නැති ද යන්න, පැමිණිල්ල ලද දිනයේ සිට වැඩ කරන දින 10ක් ඇතුළත කොමිෂන් සභාව විසින් තීරණය කළ යුතුය. යොමු කරන පාර්ශවය සතුව පිළිගත හැකි පැමිණිල්ලක් නොමැති බව කොමිෂන් සභාව විසින් තීරණය කරන්නේ නම්, යොමු කරන පාර්ශවයේ පැමිණිල්ල සහ එම කාරණාව පිළිනොගැනීම සම්බන්ධයෙන් සලකා බැලුණු කරුණු සවිස්තරාත්මකව පැහැදිලි කරමින් පැමිණිල්ල ලැබුණු දිනයේ සිට වැඩ කරන දින 15 ක් ඇතුළත එය යොමු කරන ලද පාර්ශවයට ලිඛිතව දන්වා යැවිය යුතුය.

(vi) යොමු කරන පාර්ශවයට වලංගු පැමිණිල්ලක් ඇති බව කොමිෂන් සභාව තීරණය කරන්නේ නම්, එම ආරවුල අනෙක් පාර්ශවය වෙත යොමු කරන අතර කොමිෂන් සභාව විසින් නිශ්චිතව දක්වා නොමැති නම් මිස, කොමිෂන් සභාව විසින් ආරවුල අනෙක් පාර්ශවය වෙත යොමු කළ දිනයේ සිට වැඩ කරන දින 7ක් ඇතුළත ප්‍රතිචාරයක් ඉල්ලා සිටී.

(vii) කොමිෂන් සභාව වෙනත් ආකාරයකින් සඳහන් කරන්නේ නම් මිස, කොමිෂන් සභාව විසින් ආරවුල අනෙක් පාර්ශවය වෙත යොමු කළ දිනයේ සිට වැඩ කරන දින 7ක් ඇතුළත අනෙක් පාර්ශවය කොමිෂන් සභාව වෙත පිළිතුරු සැපයිය යුතුය.

(viii) යොමු කරන පාර්ශවය විසින් මතු කරන ලද සෑම කරුණක් සම්බන්ධයෙන්ම අනෙක් පාර්ශවය කරුණු දැක්විය යුතු අතර, පාර්ශව අතර හුවමාරු වූ යොමු කරන පාර්ශවය විසින් විශ්වාසය නොතබන ලද ලිපි සහ ඒ සම්බන්ධයෙන් ඉදිරිපත් කිරීමට කැමති ඕනෑම පිළිගත හැකි සාක්ෂිකරුවෙකුගේ ප්‍රකාශයන් ද ඇතුළුව සියලු තහවුරු කිරීමේ ලිපි ලේඛන සහ සාක්ෂි සැපයිය යුතුය.

(ix) අනෙක් පාර්ශවයේ ප්‍රතිචාරය ලැබීමෙන් පසු කොමිෂන් සභාව විසින් තව දුරටත් ලේඛනමය සාක්ෂි අවශ්‍ය වන්නේද යන්න සලකා බලන අතර, ඒ සඳහා එක් පාර්ශවයකින් හෝ දෙපාර්ශවයෙන්ම ලිඛිත ඉල්ලීම් කරනු ඇත.

(x) අවශ්‍ය සියලුම ලේඛනමය සාක්ෂි ලැබීමෙන් පසු, ආරවුල නිරාකරණය කිරීම පිළිබඳ තීරණය ගැනීමට අපේක්ෂිත දිනය පිළිබඳව කොමිෂන් සභාව විසින් පාර්ශවයන්ට දැනුම් දෙනු ඇත.

(xi) හිමිකාරී ක්‍රියාකරු විසින් ප්‍රශ්නගත විදුලි සංදේශ යටිතල පහසුකම් හවුලේ භාවිතා කල යුතු බව කොමිෂන් සභාව තීරණය කරන්නේ නම්, මෙම රෙගුලාසිවල දක්වා ඇති ක්‍රියා පටිපාටි අනුගමනය කරමින් පාර්ශවයන් යටිතල පහසුකම් හවුලේ භාවිතා කිරීමේ ගිවිසුමකට එළඹිය යුතුය.

17. මෙම රෙගුලාසි යටතේ ප්‍රතිතරඟකාරී බලපෑම තක්සේරු කිරීම සඳහා කොමිෂන් සභාව විසින් ප්‍රකාශයට පත් කරන ලද තරඟකාරිත්වය පිළිබඳ රීති (Competition Rules) අදාළ වේ.

18. මෙම රෙගුලාසි ක්‍රියාත්මක කිරීම සඳහා පනතෙහි ප්‍රකාරව යටිතල පහසුකම් හවුලේ භාවිතා කිරීම සඳහා කොමිෂන් සභාව විසින් ක්‍රියාකරුවන්ට නියෝග නිකුත් කළ හැකිය.

19. **අර්ථ නිරූපණ**

මෙම රෙගුලාසි තුළ, සන්දර්භය වෙනත් ආකාරයකින් අවශ්‍ය නොවේ නම් මිස:

"පනත"යන්නෙන් අදහස් වන්නේ 1991 අංක 25 දරන ශ්‍රී ලංකා විදුලි සංදේශ පනත සහ එහි සංශෝධනයන් ය.

"අයදුම්කරුවන්" යන්නෙන් අදහස් වන්නේ යටිතල පහසුකම් හවුලේ භාවිතා කිරීමේ ගිවිසුම (ISA)හි සහභාගී වන පාර්ශවයන් - හිමිකාරි ක්‍රියාකරු සහ හවුලේ භාවිතා කිරීමේ ක්‍රියාකරු.

''කොමිෂන් සභාව'' යනු 1996 අංක 27 දරන පනත යටතේ පිහිටුවන ලද ශ්‍රී ලංකා විදුලි සංදේශ නියාමන කොමිෂන් සභාවයි

''යටිතල පහසුකම් හවුලේ භාවිතා කිරීමේ ගිවිසුම (ISA)"යනු හිමිකරුගේ විදුලි සංදේශ ජාල යටිතල පහසුකම් (සක්‍රීය සහ අක්‍රීය) හවුලේ භාවිතා කිරීම සඳහා හිමිකාරී ක්‍රියාකරුවෙකු සහ හවුලේ භාවිතා කිරීමේ ක්‍රියාකරුවෙකු අතර ඇති ගිවිසුමකි.

''සාකච්ඡා කරනු ලබන ක්‍රියාකරු'' යන්නෙන් අදහස් කරන්නේ යටිතල පහසුකම් හවුලේ භාවිතා කිරීමේ ගිවිසුමක් සාකච්ඡා කරනු ලබන ඉල්ලුම් කරන ක්‍රියාකරු සහ හිමිකාරි ක්‍රියාකරු

''හිමිකාරි ක්‍රියාකරු'' යන්නෙන් අදහස් වන්නේ විදුලි සංදේශ ජාල යටිතල පහසුකම් හිමි, ක්‍රියාත්මක කරන හෝ භාවිතා කරන ක්‍රියාකරුවෙකි.

''සැපයුම්කරු'' යන්නෙන් අදහස් වන්නේ විදුලි සංදේශ සේවා, යටිතල පහසුකම් හෝ කේබල් ගොඩබෑමේ ස්ථාන පහසුකම් සැපයීම සඳහා පනතේ 17B වගන්තිය යටතේ බලපත්‍රයක් මගින් බලය ලත් තැනැත්තෙකි.

''යොමු කරන පාර්ශවය'' යන්නෙන් අදහස් කරන්නේ ආරවුලක් කොමිෂන් සභාව වෙත යොමු කරන සාකච්ඡා කරනු ලබන ක්‍රියාකරුවෙකි.

''රේඩියෝ ප්‍රවේශ ජාලය (RAN)"යනු රේඩියෝ සබැඳියක් හරහා අවසාන පරිශීලක උපාංග මූලික ජාලයට සම්බන්ධ කරන විදුලි සංදේශ ජාලයක කොටසකි.

''ඉල්ලුම් කරන ක්‍රියාකරු'' යන්නෙන් අදහස් කරන්නේ හිමිකාරී ක්‍රියාකරුවෙකුට හවුලේ භාවිතා කිරීමේ ඉල්ලීමක් ඉදිරිපත් කරන බලපත්‍රලාභී විදුලි සංදේශ පද්ධති ක්‍රියාකරුය.


''හවුලේ භාවිතා කිරීමේ ක්‍රියාකරු'' යනු අනුමත යටිතල පහසුකම් හවුලේ භාවිතා කිරීමේ ගිවිසුම (ISA) කට යටත්ව හිමිකාරී ක්‍රියාකරුගේ විදුලි සංදේශ යටිතල පහසුකම් හවුලේ භාවිතා කරන ක්‍රියාකරුවෙකි.

''හවුලේ භාවිතා කිරීමේ ඉල්ලීම'' යන්නෙන් අදහස් වන්නේ විදුලි සංදේශ යටිතල පහසුකම් හවුලේ භාවිතා කිරීමේ සඳහා හවුලේ භාවිතා කිරීමේ ක්‍රියාකරුවෙකු විසින් හිමිකාරී ක්‍රියාකරුවෙකු වෙතින් කරනු ලබන ලිඛිත ඉල්ලීමකි.

''යටිතල පහසුකම'' යන්නෙන් අදහස් වන්නේ විදුලි සංදේශ සේවා සැපයීමේ කාර්ය සඳහා භාවිතා කරන සබැඳියක් , සමුද්‍රාන්ත කේබල, බෙදා හැරීමේ අග්‍රයක්, ප්‍රනාල පද්ධතියක්, කුහරයක්, උමගක්, කුටීරයක්, කුළුණක්, කණුවක්, ඇන්ටෙනා ව්‍යුහයක් සහ සක්‍රිය ජාලයකි.

**01 වන පරිශිෂ්ටය**

යටිතල පහසුකම් හවුලේ භාවිතා කිරීමේ ගිවිසුම (ISA) සමාලෝචනය කිරීමේ ක්‍රියාවලිය: අදියර 1- 6



ඇමුණුම A

යටිතල පහසුකම් හවුලේ භාවිතා කිරීම සඳහා ඉල්ලුම් පත්‍රය

(ඉල්ලුම් කරනු ලබන ක්‍රියාකරු විසින් සම්පුර්ණ කළ යුතුය)

1. ඉල්ලුම් කරන/හවුලේ භාවිතා කරන ක්‍රියාකරුගේ විස්තරඃ

අ. බලපත්‍රලාභීයාගේ /සමාගමේ නමඃ

ආ. බලපත්‍ර අංකය සහ නිකුත් කළ /අලුත් කළ දිනයඃ

ඇ. ඉල්ලුම් කරන/හවුලේ භාවිතා කරන ක්‍රියාකරු විසින් සපයනු ලබන විදුලි සංදේශ සේවා වර්ග (ය) ඃ

2. හිමිකාරී ක්‍රියාකරුගේ විස්තරඃ

අ. බලපත්‍රලාභීයාගේ /සමාගමේ නමඃ

ආ. බලපත්‍ර අංකය සහ නිකුත් කළ /අලුත් කළ දිනයඃ

ඇ. හිමිකාරී ක්‍රියාකරු විසින් සපයනු ලබන විදුලි සංදේශ සේවා වර්ග(ය)ඃ

3. හිමිකාරී ක්‍රියාකරුගේ අනුමැතියේ විස්තරඃ

| *අංකය* | *අයිතමය* | *විස්තරය* |
|---|---|---|
| 1. | ඉල්ලීමෙහි යොමු අංකය | |
| 2. | යටිතල පහසුකම/ම් වර්ගය | |
| 3. | යටිතල පහසුකම පිහිටි ස්ථානය/ලිපිනය | |
| 4. | යටිතල පහසුකම හවුලේ භාවිතා කිරීමේ අරමුණ | |
| 5. | හවුලේ භාවිතා කිරීමේ කාලසීමාව | |
| 6. | ඉල්ලුම් කරන/හවුලේ භාවිතා කරන ක්‍රියාකරු විසින් ඉල්ලීම කළ දිනය | |
| 7. | හිමිකාරී ක්‍රියාකරු විසින් අනුමත කරන ලද/ප්‍රතික්ෂේප කරන ලද අවසාන දිනය | |
| 8. | සාකච්ඡා අවසන් කල යුතු දිනය | |
| 9. | ඉල්ලුම් කරන/හවුලේ භාවිතා කිරීමේ ක්‍රියාකරුගේ ඉල්ලීම මත යටිතල පහසුකම් සම්බන්ධව පරීක්ෂා කිරීම හෝ සෝදිසි කිරීමේ අවශ්‍යතාවය | |
| 10. | වෙනත් ඕනෑම තොරතුරක් | |

..........................................................................................

ඉල්ලුම් කරන/හවුලේ භාවිතා කරන ක්‍රියාකරුගේ බලයලත් නිලධාරියාගේ අත්සන

ඇමුණුම B

**යටිතල පහසුකම් හවුලේ භාවිතා කිරීම අනුමත/ප්‍රතික්ෂේපකිරීමේ පෝරමය**

1. ඉල්ලුම් කරන/හවුලේ භාවිතා කරන ක්‍රියාකරුගේ විස්තරඃ

අ. බලපත්‍රලාභීයාගේ /සමාගමේ නමඃ

ආ. බලපත්‍ර අංකය සහ නිකුත් කළ /අලුත් කළ දිනයඃ

ඇ. ඉල්ලුම් කරන/හවුලේ භාවිතා කරන ක්‍රියාකරු විසින් සපයනු ලබන විදුලි සංදේශ සේවා වර්ග(ය)ඃ

2. හිමිකාරී ක්‍රියාකරුගේ විස්තරඃ

අ. බලපත්‍රලාභීයාගේ /සමාගමේ නමඃ

ආ. බලපත්‍ර අංකය සහ නිකුත් කළ /අලුත් කළ දිනයඃ

ඇ. හිමිකාරී ක්‍රියාකරු විසින් සපයනු ලබන විදුලි සංදේශ සේවා වර්ග(ය)ඃ

3. හිමිකාරී ක්‍රියාකරු විසින් අනුමත කිරීම පිළිබඳ විස්තරඃ

| *අංකය* | *අයිතමය* | *විස්තරය* |
|---|---|---|
| 1. | ඉල්ලුම් කරන/හවුලේ භාවිතා කරන ක්‍රියාකරු විසින්කරන ලද ඉල්ලීමෙහි යොමු අංකය | |
| 2. | අනුමැතියේ යොමු අංකය | |
| 3. | යටිතල පහසුකම/ම් වර්ගය | |
| 4. | යටිතල පහසුකම් පිහිටි ස්ථානය/ලිපිනය | |
| 5. | හවුලේ භාවිතා කිරීමේ කාලසීමාව | |
| 6. | ගිවිසුමෙහි/තීරණයෙහි දිනය | |
| 7. | වෙනත් ඕනෑම තොරතුරක් | |

4. හිමිකාරී ක්‍රියාකරු විසින් ප්‍රතික්ෂේප කිරීම පිළිබඳ විස්තරඃ

| *අංකය* | *අයිතමය* | *විස්තරය* |
|---|---|---|
| 1. | ඉල්ලුම් කරන/හවුලේ භාවිතා කරන ක්‍රියාකරු විසින් කරන ලද ඉල්ලීමෙහි යොමු අංකය | |
| 2. | ප්‍රතික්ෂේප කිරීමට අදාළ යොමු අංකය | |
| 3. | යටිතල පහසුකම/ම් වර්ගය | |
| 4. | යටිතල පහසුකම් පිහිටි ස්ථානය/ලිපිනය | |
| 5. | ප්‍රතික්ෂේප කිරීමට හේතුව | |
| 6. | වෙනත් ඕනෑම තොරතුරක් | |

..........................................................................

හිමිකාරී ක්‍රියාකරුගේ බලයලත් නිලධාරියාගේ අත්සන

ඇමුණුම C

**යටිතල පහසුකම් හවුලේ භාවිතා කිරීමේ ඒකාබද්ධ අයදුම් පත්‍රය**

1. අයදුම්කරුවන්ගේ සාමාන්‍ය තොරතුරු

A. ඉල්ලුම් කරන/හවුලේ භාවිතා කරන ක්‍රියාකරුගේ විස්තරː

අ. බලපත්‍රලාභියාගේ /සමාගමේ නමː

ආ. බලපත්‍ර අංකය සහ නිකුත් කළ /අලුත් කළ දිනයː

ඇ. ඉල්ලුම් කරන/හවුලේ භාවිතා කරන ක්‍රියාකරු විසින් සපයනු ලබන විදුලි සංදේශ සේවා වර්ග(ය)ː

B. හිමිකාරී ක්‍රියාකරුගේ විස්තරː

අ. බලපත්‍රලාභියාගේ /සමාගමේ නමː

ආ. බලපත්‍ර අංකය සහ නිකුත් කළ /අලුත් කළ දිනයː

ඇ. හිමිකාරී ක්‍රියාකරු විසින් සපයනු ලබන විදුලි සංදේශ සේවා වර්ග(ය)ː

2. යෝජිත යටිතල පහසුකම් හවුලේ භාවිතා කරන ගිවිසුම (ISA)හි විෂය පථය

හවුලේ භාවිත කරනු ලබන යටිතල පහසුකම් පිළිබඳ විස්තරː

| *අංකය* | *අයිතමය* | *විස්තරය* |
|---|---|---|
| 1. | ඉල්ලීමෙහි යොමු අංකය | |
| 2. | යටිතල පහසුකම/ම් වර්ගය | |
| 3. | හවුලේ භාවිතා කිරීමේ ශෛලියන්/ සැලසුම් | |
| 4. | යටිතල පහසුකම් පිහිටි ස්ථානය/ලිපිනය | |
| 5. | යටිතල පහසුකම් හවුලේ භාවිතා කිරීමේ / මූලික හේතුව (රෙගුලාසි අංක 13.2, 13.3, 13.4 අනුව තොරතුරු සහ ආයෝජන සැලැස්ම, ජාල ව්‍යාප්ති සැලැස්ම කරුණාකර ඉදිරිපත් කරන්න) | |
| 6. | හඳුනාගත හැකි අවදානම් පිළිබඳ කෙටි තක්සේරුවක් (රෙගුලාසිඅංක 13.3, 13.5, 13.7, 13.9 අනුව සහ නියාමන අවදානම් අවම කිරීමේ තොරතුරු කරුණාකර ඉදිරිපත් කරන්න) | |
| 7. | හවුලේ භාවිතා කිරීමේ කාලසීමාව | |
| 8. | ඉල්ලුම් කරන/හවුලේ භාවිතා කරන ක්‍රියාකරු විසින් ඉල්ලීම් කළ දිනය | |
| 9. | හිමිකාරී ක්‍රියාකරු විසින් අනුමත කරන ලද/ප්‍රතික්ෂේප කරන ලද අවසාන දිනය | |
| 10. | යෝජිත යටිතල පහසුකම් හවුලේ භාවිතා කිරීමේ ගිවිසුමෙහි කෙටුම්පතක් | |
| 11. | ඉල්ලුම් කරන/හවුලේ භාවිතා කරන ක්‍රියාකරු විසින් යටිතල පහසුකම් පරීක්ෂා කිරීම හෝ සෝදිසි කිරීමේ අවශ්‍යතාවය | |
| 12. | වෙනත් ඕනෑම තොරතුරක් | |

...............................................

ඉල්ලුම් කරන ක්‍රියාකරුගේ අත්සන හිමිකාරී ක්‍රියාකරුගේ අත්සන

උපදෙස් ː

1. අදාළ අංශය වෙත ද පිටපතක් සහිතව නිසි පරිදි සම්පූර්ණ කරන ලද අයදුම්පත්‍රය ශ්‍රී ලංකා විදුලි සංදේශ නියාමන කොමිෂන් සභාවේ අධ්‍යක්ෂ ජනරාල්වරයා වෙත ඉදිරිපත් කළ යුතුය.

EOG 08 - 0093

ශ්‍රී ලංකා රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ මුද්‍රණය කරන ලදී.